# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2336/70 - 2023 ජූනි මස 16 වැනි සිකුරාදා - 2023.06.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

**අංක 01/2023 දරන සුරාබදු නිවේදනය**

ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන පානීය නොවන ස්ප්‍රීතු සඳහා වූ රීති සංශෝධනය

(52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වන වගන්තිය සමග කියවිය යුතු 2, 12, 22 සහ 25 වන වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින් මෙම නිවේදනය මගින් 2018 ජූනි මස 13 වන දිනැති අංක 2075/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 10/2018 දරන සුරාබදු නිවේදනයේ රීති මගින් සංශෝධනය කරන ලද 2018 පෙබරවාරි මස 21 වන දිනැති අංක 2059/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 07/2018 දරන සුරාබදු නිවේදනය, I උපලේඛනයේ 2. ප්‍රොපයිල් මධ්‍යසාරය/අයිසො ප්‍රොපයිල් මධ්‍යසාරය සඳහා පමණක් අදාළ වන ලෙස 2023 ජූනි 17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙහි දක්වා ඇති රීතිවලට අනුව සංශෝධනය කරනු ලැබේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 ජූනි මස 16 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

1A - PG 6402 — 406 (2023/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**රීති**

1. ඉහත සඳහන් කළ සුරාබදු නිවේදන 10/2018 රීති 17 මඟින් සංශෝධනය කරන ලද පරිදි IV වන උපලේඛනයේ III ආකෘතියෙහි කොන්දේසි අංක 5 හි "කිලෝ ග්‍රෑම් 7.5" යන වචන පරිච්ඡින්න කිරීම හා ඒ වෙනුවට "කිලෝ ග්‍රෑම් 15" යන වචන I උපලේඛනයේ 2. ප්‍රොපයිල් මධ්‍යසාරය/අයිසො ප්‍රොපයිල් මධ්‍යසාරය සඳහා පමණක් ආදේශ කිරීම.

2. ඉහත සඳහන් කළ සුරාබදු නිවේදන 10/2018 රීති 18 මඟින් සංශෝධනය කරන ලද පරිදි IV වන උපලේඛනයේ III ආකෘතියෙහි කොන්දේසි අංක 6 හි "කිලෝ ග්‍රෑම් 1000" යන වචන පරිච්ඡින්න කිරීම හා වෙනුවට "කිලෝ ග්‍රෑම් 2000" යන වචන I උපලේඛනයේ 2. ප්‍රොපයිල් මධ්‍යසාරය/අයිසො ප්‍රොපයිල් මධ්‍යසාරය සඳහා පමණක් ආදේශ කිරීම.

EOG 07 - 0203

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.